**ජනාධිපතිවරයාගේ අරමුදල - 2013**
**---------------------------------------**

ජනාධිපතිවරයාගේ අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 7 දරන ජනාධිපතිවරයාගේ අරමුදල් පනතේ 9(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. අරමුදල් පනතේ 10 වගන්තිය ප්‍රකාරව ගරු මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙත ඉදිරිපත් කළ යුතු එකී පනතේ 9(4) වගන්තියෙහි සඳහන් ආදායම් හා වියදම් ප්‍රකාශනය ඇමුණුම 01 ලෙසද, මුදල් ආයෝජනය කිරීම පිළිබඳ ප්‍රකාශනය ඇමුණුම 02 ලෙසද ඇතුළත් කර, අරමුදලේ කටයුතු පරිපාලනය කිරීම පිළිබඳ වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**-----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI – 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරිවන විගණන සාක්ෂි ලබා ගැනිම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයිමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**2. මූල්‍ය ප්‍රකාශන**

**-------------------**

**2.1 මතය**

**-------**

මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ජනාධිපතිවරයාගේ අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**-----------------------------------**

ජාතික නිවාස සංවර්ධන අධිකාරියට 1991 වර්ෂයේදී ලබාදී ඇති රු. 250,000,000 ක ණය මුදලින් තවදුරටත් ලැබිය යුතු ශේෂය රු .195,000,000 ක් වන අතර, සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට අයවිය යුතු පොළිය රු. 286,656,164 ක් විය. 2008 වර්ෂයේ සිට මෙම ණය මුදල හා පොළී මුදල් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**------------------------**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

**---------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.531,049,940 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.149,685,390 ක් විය. ඉකුත් වර්ෂය හා සැසඳීමේදී මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.381,364,550 ක වර්ධනයක් දක්නට ලැබුණි. එහෙත් මෙම මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට බලපෑ පොළී ආදායම තුළ අන්තර්ගත රු.29,250,000 ක ජාතික නිවාස සංවර්ධන අධිකාරියෙන් ලැබිය යුතු ණය පොළිය ලැබීමේ අවිනිශ්චිතතාවයක් පවතී.

**3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

**-----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙන් ලැබී තිබුණු රු.මිලියන 2,009 ක මුදල මුළු ආදායමෙන් සියයට 88.18 ක් වූ අතර එය ඉකුත් වර්ෂයේ ලැබීම් වූ රු.මිලියන 1,648 සමඟ සැසඳීමේදී රු.මිලියන 361 ක් හෙවත් සියයට 21.90 ක වැඩිවීමකි. ඉකුත් වර්ෂයේ අරමුදලේ ආයෝජන රු.මිලියන 1,201 ක් වුයෙන් සමාලෝචිත වර්ෂයේදී එය රු.මිලියන 1,701 ක් දක්වා සියයට 41.63 ක වර්ධනයක් අත්කර ගැනීමට සමත් වී තිබුණි.

(ආ) අරමුදලේ අපේක්ෂිත අරමුණු ඉටු කිරීම සඳහා ඉකුත් වර්ෂයේදී රු.මිලියන 1,713 ක් වැය කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 1,747 ක් වැය කර තිබුණි. අරමුදලේ වියදම් දැරීමේදී ඉකුත් වර්ෂයට සාපේක්ෂව ආගමික කටයුතු, සුභ සාධන කටයුතු හා විශේෂ ව්‍යාපෘති සඳහා දරන ලද වියදමෙහි පිළිවෙලින් සියයට 1,323 ක්, සියයට 825 ක් හා සියයට 2,889 ක වර්ධනයක් දක්නට ලැබුණි. එහෙත් වෛද්‍යාධාර හා අධ්‍යාපන කටයුතු වෙනුවෙන් දරන ලද වියදම පසුගිය වර්ෂයට සාපේක්ෂව පිළිවෙලින් සියයට 19 ක හා සියයට 95 ක ප්‍රමාණයකින් අඩුවී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**
-----------------------------

**4.1 කාර්යසාධනය**
------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී අරමුදල විසින් වෛද්‍යාධාර ගෙවීම්, සංස්කෘතික කටයුතු, ආගමික කටයුතු, සුභසාධන කටයුතු, අධ්‍යාපනික කටයුතු, ක්‍රීඩා හා කලා කටයුතු, දේශිය හා විදේශ ශිෂ්‍යත්ව ප්‍රදානය හා විශේෂ ව්‍යාපෘති සඳහා එකතුව රු.මිලියන 851.26 ක් වැය කර තිබුණි. එම මුළු වියදමෙන් වෛද්‍යාධාර සඳහා රු.මිලියන 697.53 ක් හෙවත් සියයට 81.94 ක් හා විදේශීය හා දේශිය ශිෂ්‍යත්ව සඳහා රු.මිලියන 110.34 ක් හෙවත් මුළු වියදමෙන් සියයට 12.96 ක් වියදම් කර තිබුණු අතර අනෙක් අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා වැය කර තිබුණේ මුළු වියදමෙන් සියයට 5.10 ක් හෙවත් රු.මිලියන 43.39 ක් පමණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී වෛද්‍යාධාර වශයෙන් හෘද සැත්කම් 3,645 ක් සඳහා රු.මිලියන 466.93 ක් ද, පිළිකා ප්‍රතිකාර 465 ක් සඳහා රු.මිලියන 47.96 ක් ද, වකුගඩු බද්ධ කිරීම් 318 ක් සඳහා රු.මිලියන 53.37 ක් ද, වෙනත් ප්‍රතිකාර 683 ක් සඳහා රු.මිලියන 129.27 ක් ද වැය කර තිබුණි. ඉකුත් වර්ෂයේදී රෝගීන් 6,209 ක් සඳහා රු.මිලියන 857.64 ක වැය කිරීම සමඟ සැසඳීමේදී රෝගීන් ප්‍රමාණය 1,098 කින් හා වියදම රු.මිලියන 160.11 කින් අඩුවී තිබුණි.

(ඇ) දිවයිනේ පළාත් 09 ආවරණය වන පරිදි අ.පො.ස (උසස් පෙළ) හදාරණ ශිෂ්‍යයන් 18,224 දෙනෙකුට ශිෂ්‍යත්ව වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 109.34 ක් වැය කර තිබුණු අතර රු.මිලියන 1.0 ක් විදේශ ශිෂ්‍යත්වයක් වෙනුවෙන් වැය කර තිබුණි

**4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**
-------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වකුගඩු රෝගියෙකු වෙනුවෙන් සැත්කමක් කිරීම සඳහා අරමුදලින් අනුමත වූ රු.300,000 ක මුදල ගෙවීමට පෙර රෝගියා මිය යාම නිසා ඔහුගේ යැපුම්කරුවන් වූ දරු දෙදෙනා වෙනුවෙන් එම මුදල යොදා ස්ථාවර තැන්පත් ගිණුම් විවෘත කර දීමට 2011 අගෝස්තු 10 වන දින අනුමත වී තිබුණි. කෙසේ වුවද එම අවශ්‍යතාවය ඉටු කිරීම සඳහා අරමුදලට අවුරුදු 02 මාස 03 ක කාලයක් ගත වී තිබුණි. එම නිසා එම කාලය තුළ ලැබීමට තිබු රු.60,000 ක් වූ පොළී ආදායම ඔවුන්ට අහිමි වී තිබුණි.

(ආ) 2013 වර්ෂයේ උසස් පෙල විභාගයට පෙනී සිටි සබරගමුව පළාතේ නිවිතිගල අධ්‍යාපන කලාපයේ ශිෂ්‍යත්වලාභීන්ට ශිෂ්‍යාධාරයේ දෙවන වාරිකය විභාගයට පෙර ලබා දීමට අපොහොසත් වී තිබුණි. මෙවැනි කටයුතු නිසා ශිෂ්‍යත්ව ලබා දීමේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට නොහැකිවන බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ) මධ්‍යම පළාතේ ශිෂ්‍යත්ව නාම ලේඛනයෙහි උසස් පෙළ හැදෑරීමට සුදුසුකම් නැති ශිෂ්‍යයින් පස් දෙනෙකු ඇතුළත් කිරීම තුළින් සුදුසුකම් ඇති ශිෂ්‍යයින් පස් දෙනෙකුගේ අවස්ථාවන් අහුරා තිබුණි.

(ඈ) අරමුදලෙන් පුද්ගලයකුට මූල්‍යාධාරයක් ලෙස මාසික පොළියක් පමණක් ලබා දීමේ අරමුණින් ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ඔහුගේ පෞද්ගලික නමින් ආරම්භ කර තිබු රු.50,000 ක ස්ථාවර තැන්පතුව සමාලෝචිත වර්ෂයේදී අරමුදලට නොදන්වා මුදල් කරගෙන

එම සම්පූර්ණ මුදලම ඔහු විසින් ලබාගෙන තිබුණත් එම මුදල නැවත අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**5. අයවැය ලේඛනමය පාලනය**

-------------------------------

අරමුදලේ සමාලෝචිත වර්ෂයේ ආදායම් හා වියදම් තථ්‍ය අගයන්, අනුමත අයවැය අගයන් සමඟ සැසඳීමේදී සියයට 23 සිට සියයට 93 දක්වා වූ පරාසයක විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

-----------------------

විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන දුර්වලතාවයන් අරමුදලේ ලේකම් වෙත වරින්වර පෙන්වා දෙන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) අරමුදල් උපයෝජනය

(ආ) ලැබිය යුතු මුදල්

**ඇමුණුම 01**

**--------------**

**ආදායම් හා වියදම් ප්‍රකාශය**

**---------------------------------**

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ ආදායම් හා වියදම් ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත දක්වා ඇත.

| | **දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා** | | | |
|---|---|---|---|---|
| **ආදායම** | **2013** | | **2012** | |
| | රු. | රු. | රු. | රු. |
| දායකයන් ලැබීම | 63,506,485 | | 59,758,878 | |
| පොළී ආදායම | 205,855,975 | | 155,469,134 | |
| සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙන් ලැබීම | 2,009,375,000 | 2,278,737,460 | 1,648,471,001 | 1,863,699,013 |
| **වියදම** | | | | |
| විගණන ගාස්තු | 150,000 | | 150,000 | |
| ලිපිද්‍රව්‍ය | 13,500 | | - | |
| නීති වියදම් | 3,000 | | - | |
| වෛද්‍යාධාර ගෙවීම | 697,529,990 | | 857,641,805 | |
| සංස්කෘතික කටයුතු | 1,075,000 | | 7,385,000 | |
| ආගමික කටයුතු | 9,250,000 | | 650,000 | |
| සුභ සාධන කටයුතු | 5,658,250 | | 611,750 | |
| අධ්‍යාපන කටයුතු | 500,000 | | 10,200,000 | |
| ක්‍රීඩා හා කලා කටයුතු | 3,000,000 | | - | |
| ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමයේ වියදම් | 110,344,000 | | 102,447,038 | |
| මහපොළ උසස් අධ්‍යාපන අරමුදලට 50% දායකය | 896,255,500 | | 734,128,030 | |
| විශේෂ ව්‍යාපෘති | 23,908,280 | 1,747,521,020 | 800,000 | 1,714,013,623 |
| වියදම ඉක්ම වූ ආදායමේ අතිරික්තය | | 531,049,940 | | 149,685,390 |

**ඇමුණුම 02**

**--------------**

**අරමුදලට අයත් මුදල් ආයෝජනය පිළිබඳ ප්‍රකාශය**

**------------------------------------------------------------**

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනට අරමුදලට අයත් මුදල් ආයෝජනය කිරීම පිළිබඳ විස්තර පහත සඳහන් වගුවෙන් දැක්වේ.

| ආයෝජන වර්ගය | 2013 ජනවාරි 01 දිනට ශේෂය | 2013 වර්ෂයේ ආයෝජන | 2013 වර්ෂයේ ආපසු ගැනීම් | 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ස්ථාවර තැන්පත් | 820,585,000 | 209,515,000 | - | 1,030,100,000 |
| මහජන බැංකුව ස්ථාවර තැන්පත් | 15,000,000 | - | 15,000,000 | - |
| ලංකා බැංකුව ස්ථාවර තැන්පත් | 45,000 | 305,710,000 | - | 305,755,000 |
| සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ආයෝජන | 2,200,000 | - | - | 2,200,000 |
| භාණ්ඩාගාර පරිපාලන ණය | 363,375,000 | - | - | 363,375,000 |
| | 1,201,205,000 | 515,225,000 | 15,000,000 | 1,701,430,000 |